# මූලික ආර්ථික විද්‍යා මූලධර්ම විග්‍රහය

පී. සමරසිරි



ශ්‍රී ලංකා මහ බැංකුව



අජිත් නිවාඩ් කබ්රාල්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව



පී. සමරසිරි

## මෙම පොත සහ කතුවරයා ගැන

මෙම ආර්ථික විද්‍යා විෂය ග්‍රන්ථය පී. සමරසිරි මහතා විසින් සැකසීම ජාතික කර්තව්‍යයක් ඉටු කිරීමක් බව මගේ හැඟීමයි. ආර්ථික විද්‍යාව පිළිබඳව අධ්‍යයනය කටයුතු සඳහා පරිශීලණයට සිංහල භාෂාවෙන් ප්‍රකාශිත පොතපත ඉතාම විරලය. සංකීර්ණ මාතෘකා පිළිබඳව න්‍යායාත්මක කරුණු මෙන්ම ප්‍රායෝගික කරුණුද ඉතාමත් සරල බස් වහරක් යොදාගෙන ඉදිරිපත් කොට ඇති බැවින් මෙම ග්‍රන්ථය පරිශීලණය කරන අයට ඉතා පහසුවෙන් සංකීර්ණ විෂය කරුණු අවබෝධ කරගත හැකිවනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2010 අගෝස්තු මස ප්‍රකාශයට පත් කරන ලද "මුදල් ගණුදෙනු, බැංකු සහ ආර්ථිකය" යන ග්‍රන්ථයේ කතුවරයා ද සමරසිරි මහතාය. මෙම ග්‍රන්ථය දැනටමත් තෙවරක් මුද්‍රණය කිරීමෙන් එහි වැදගත්කම මනාව පැහැදිලිය.

සමරසිරි මහතා පසුගිය වසර 28 ක කාලය තුල ආර්ථික හා මූල්‍ය විෂයන් රාශියක් සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවය කිරීමෙන් ලද පෘථුල දැනුම මෙම ග්‍රන්ථය තුලින් මනාව පිළිබිඹු වෙයි. ආර්ථික විද්‍යාව පිළිබඳව කොළඹ විශ්ව විද්‍යාලයෙන් ගෞරව උපාධියක්ද ඇමෙරිකා එක්සත් ජනපදයේ කැන්සස් විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක්ද ලබා ඇති ඔහු දේශීය සහ විදේශීය වශයෙන් ආර්ථික සහ මූල්‍ය විෂයන් පිළිබඳ පුහුණු පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ විශාල ප්‍රමාණයකට සහභාගීවී ඇති අතර ශාස්ත්‍රීය ලිපි රාශියක් පළකොට ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ ලෙසද සේවය කල ඒ මහතා දැනට මූල්‍ය ස්ථායීතා කාර්ය අංශය අධීක්ෂණය භාර සහකාර අධිපතිවරයා සහ මුදල් මණ්ඩලයේ ලේකම් වශයෙන්ද ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ සභාපති වශයෙන්ද ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ උප සභාපති වශයෙන්ද සේවය කරන ආර්ථික විද්‍යාව පිළිබඳ අත්දැකීම් සහ දැනීම බහුල කෙනෙකි.

මෙම ග්‍රන්ථයේ අඩංගු විෂය කරුණු දෙස බැලීමේදී අ.පො.ස. උසස් පෙළ, විශ්ව විද්‍යාල සහ වෘත්තීමය පාඨමාලාවන්හි මූල්‍ය සහ ආර්ථික විද්‍යාව හදාරණ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ උගතුන්ට මෙය ඉතා ප්‍රයෝජනවත් ග්‍රන්ථයකි. ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික සහ මූල්‍ය විෂයන් සම්බන්ධ දැනීම මහජනයා අතර බෙදා හැරීමට විවිධ ප්‍රකාශනයන් සහ වැඩ සටහන් යොදා ගන්නා අතර එහි එක් පියවරක් වශයෙන් සමරසිරි මහතාගේ මෙම දෙවැනි කෘතිය ප්‍රකාශයට පත්කරනුයේ ඉතාමත් සතුටිනි. මෙම ග්‍රන්ථය තුලින් අනාගතයේ විශාල පිරිසකගේ ආර්ථික විද්‍යා දැනීම ප්‍රගුණ කෙරෙන බව මගේ දැඩි විශ්වාසයයි.

ISBN – 978-955-575-223-7

මුද්‍රණය: ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලය,
රාජගිරිය

මිළ රු. 400/-